**<u>විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා දේශපාලන කටයුතු පිළිබඳ අමෙරිකානු උප රාජ්‍ය ලේකම් තෝමස් ෂැනන් මහතා හමුවීමෙන් පසු කළ ප්‍රකාශය (14.12.2015)</u>**

සුභ සන්ධ්‍යාවක් නෝනාවරුනි මහත්වරුනි,

දේශපාලන කටයුතු පිළිබඳ ඇමරිකානු උප රාජ්‍ය ලේකම් තෝමස් ෂැනන් මහතා මේ සන්ධ්‍යාවේ පිළිගැනීම මහත් ගෞරවයක් හා වරප්‍රසාදයක් ලෙස සලකමි.

ඔබ සැවොම දන්නා පරිදි, තානාපති ෂැනන් ඇමෙරිකානු විදේශ සේවයේ සිටින ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන අතර එරට ඉතිහාසයේ දේශපාලන කටයුතු පිළිබඳ උප රාජ්‍ය ලේකම් තනතුර දරන 14 වන පුද්ගලයා ද වේ.

ඇමරිකානු හා ශ්‍රී ලාංකික සබඳතා ගත් කළ මෙම වසර සුවිශේෂී සන්දිස්ථාන රාශියකින් හෙබි වසරක් ලෙස හඳුන්වා දිය හැක.

මෙම වසරේ ජනවාරි මාසයේ සිට එක්සත් ජනපදයේ නියෝජිතයන් විසින් සිදු කරන ලද වැදගත් සංචාරවල තවත් අදියරක් ලෙස තානාපති ෂැනන්ගේ සංචාරය විදහා දැක්විය හැක.

- ජනවාරි මස 8 වැනි දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් නිශා බිස්වාල් මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණි බව ඔබට සිහිපත් වනු ඇත. ඇත්තවශයෙන්ම ඇයගේ මෙම සංචාරය ඇමෙරිකානු ශ්‍රී ලාංකික සම්බන්ධතා නැවත අලුත්වැඩියා කිරීමට මුල පිරුවේය.

- එම සංචාරයෙන් අනතුරුව ඇමෙරිකානු රාජ්‍ය ලේකම් ගරු ජෝන් කෙරී මහතාගේ මැයි මස සංචාරය වසර 43 කට පසුව රාජ්‍ය ලේකම්වරයකු විසින් ශ්‍රී ලංකාවේ නිරත වූ පළමු නිල සංචාරය ද වේ.

- පාර්ලිමේන්තු මැතිවරණයෙන් ටික දිනකට පසුව අගෝස්තු මස මෙරට සංචාරය කළ සහකාර රාජ්‍ය ලේකම් නිශා බිස්වාල් මහත්මිය හා ටොම් මැලිනොව්ස්කි මහතා ගේ සහ පසුගිය මාසයේ මෙහි පැමිණි ඇමෙරිකානු කැබිනට් මණ්ඩලයේ නියෝජිත තානාපතිනී සමන්තා පවර් මහත්මියගේ සංචාරය ද අපගේ බැඳීම් තවතවත් ශක්තිමත් කිරීමට ඉවහල් විය. එය ජනාධිපතිවරණයෙන් අනතුරුව ගත වූ මාස 9 තුළ සිදු වූ දෙවන කැබිනට් මණ්ඩල මට්ටමේ සංචාරයයි.

තානාපති ෂැනන්ගේ සංචාරය ඇතුළුව දැනට සිදු වූ වැදගත් සංචාර වලින් පෙන්නුම් කරනු ලබන්නේ ඇමෙරිකාව හා ශ්‍රී ලංකාව අතර ඇති වූ අති විශිෂ්ට සම්බන්ධතාවය බව පැහැදිලිය.

මෙම සංචාරය තුළින් දෙරට ළඟා වී ඇති බැඳීම් ශක්තිමත් වෙනවා පමණක් නොව ස්වකීය විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආයතනයන් වන ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයට ද ඒ සඳහා දිශානතියක් ලබා දෙන බව මාගේ විශ්වාසයයි.

තානාපති ෂැනන් මහතාගේ සංචාරය සහ ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට ලබා දීමට අපේක්ෂා කරන සහය, ප්‍රජාතාන්ත්‍රික සම්ප්‍රදායන් ඉහළින්ම අනුගමනය කරමින් සෑම පුරවැසියෙකුගේම අයිතිවාසිකම් ප්‍රවර්ධනය කොට සුරක්ෂිත කරමින් අපේ සමාජයේ බහු වාර්ගික, බහු සංස්කෘතික, බහු ආගමික හා බහු භාෂාමය ස්වභාවය අගයමින් සත්‍ය වශයෙන්ම සාමකාමී, සංහිඳියාවෙන් යුත් සෞභාග්‍යමත් රටක් බවට පත් කර ගැනීම සඳහා ජනවාරි 08 වන දින අප ඇරඹූ ගමන දිරිගැන්වීමකි.

ශ්‍රී ලංකාවේ සිදුවන වෙනස්වීම්වලින් හා සාමයේ ප්‍රතිලාභ තුළින් අප රටේ ජනතාවට යහපතක් උදාවන බව තහවුරු කර ගැනීම සඳහා අපට සාමූහිකව කටයුතු කළ හැකි ක්ෂේත්‍ර මොනවාදැයි මෙම සන්ධ්‍යාවේ දී පැවැත්වූ රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. ද්විපාර්ශ්වික වෙළඳාම හා ආයෝජන මෙන්ම සාමුද්‍රීය සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා "අපගේ සාගර පිළිබඳ සම්මේලනය" ට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය වැනි අපගේ සහයෝගිතාව ශක්තිමත් කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කරන ලදී.

වඩාත් වැදගත් වන කරුණක් වන ඇමෙරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර "හවුල්කාරිත්ව සංවාද" වටවල ආකෘතිය පිළිබඳව අපි සාකච්ඡා කළෙමු. ඔබට ද මතක ඇති පරිදි මෙම වසරේ මැයි මාසයේදී ලේකම් කෙරී මහතා විසින් ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරයේ දී, ඇමෙරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර හවුල්කාරිත්ව සංවාදයක් කළ යුතු යැයි එතුමා ප්‍රකාශ කළේය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ නිලධාරියා ලෙස ෂැනන් මහතා විසින් මෙම වැදගත් හවුල්කාරිත්ව සංවාදයට මඟ පෙන්වීම් ලබා දෙනු ඇත. මෙම සංවාදය පදනම් විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව අද අපි සාකච්ඡා කොට තීරණය කළෙමු. ඒවා නම්,

1) පාලනය, සංවර්ධන සහයෝගීතාවය හා පුද්ගල-පුද්ගල සබඳතා
2) ආර්ථික සහයෝගීතාව
3) ආරක්ෂක සහයෝගීතාව හා
4) ජාත්‍යන්තර හා කලාපීය කටයුතු යන ක්ෂේත්‍රයන්ය.

මෙම ක්ෂේත්‍ර 4 පිළිබඳව තීරණය කරනු ලැබුයේ, අප රටේ ජනතාවගේ අවශ්‍යතාවලට හා ආණ්ඩුවේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අනුකූල වන අන්දමින් ඇමෙරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර සබඳතාව ගොඩනැංවී ඇති ආකාර හා ක්‍රමවේද සම්බන්ධයෙන් ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා සමග පසුගිය මාස කිහිපය මුළුල්ලේ සිදු කළ සාකච්ඡා වලින් අනතුරුවය.

මම ඉහත දී සඳහන් කල ආකාරයට තානාපති ෂැනන් මහතා අද දින දින ශ්‍රී ලංකාවට පැමිණියේය. අද පස්වරුවේදී ඔහු පැමිණි අවස්ථාවෙන් පසුව ඔහු සහභාගීවන පළමු රැස්වීම වනුයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවැත්වෙන මෙම රැස්වීමයි. හෙට දින ඔහු නැගෙනහිර පළාතේ සංචාරයක යෙදෙනු ඇත. ෂැනන් මහතා බදාදා දින ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා බැහැ දකිනු ඇත. එදිනට, ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දේශනයක් පැවැත්වීමට නියමිතය.

මෙම සංචාරයෙහි නිරතවීම සම්බන්ධයෙන් තානාපති ෂැනන් මහතාට මාගේ කෘතඥතාවය පිරිනමමි. ඔහු සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර මෙම වසරේ මැයි මාසයේ දී ලේකම් කෙරී මහතා නිරත වූ සංචාරයේදී එතුමා අපගේ සම්බන්ධතා සම්බන්ධයෙන් යෝජනා කළ ධනාත්මක ගමන් මග ඔස්සේ එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර සම්බන්ධතා තවදුරටත් වර්ධනය කිරීම සඳහා සමීපව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

මෙම අවස්ථාවේදී ගෙවී යන හැම දිනකදීම, අප දෙරට අතර බැඳීම් වඩ වඩාත් ශක්තිමත් කරනු පිණිස තානාපති අතුල් කෙශාප් මැතිතුමා සහ කොළඹ සිටින ඔහුගේ කණ්ඩායම විසින් ගන්නා අප්‍රතිහත ප්‍රයත්නයන්ට මාගේ කෘතඥතාවය පුද කිරීමටද කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ ගත කරන කාල සීමාව ඉතා ප්‍රීතිමත්ව ගත කිරීමට ලැබේවා යි! තානාපති ෂැනන් මැතිතුමාට හා ඔහුගේ කණ්ඩායමට ප්‍රර්ථනා කරන අතර ඔබ සියලු දෙනා කෙටියෙන් අමතන ලෙස තානාපති ෂැනන් මැතිතුමාට ආරාධනා කිරීමට කැමැත්තෙමි.

ස්තුතියි.